ISSN 1391 - 0000

# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள்
# LIBRARY NEWS


ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය
இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்
THE NEWS LETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

28 වන වෙළුම 3/4 කලාප 2007 ජූලි-සැප්තැම්බර්/ඔක්තෝබර්-දෙසැම්බර්
மலர் 28 இதழ் 3/4, 2007 ஜூலை-செப்ரெம்பர்/ஒக்தோபர்-டிசம்பர்
volume 28 No. 3/4 July-September/October-December 2007

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

# ජාතික කියවීමේ මාසය - 2007
# සමාරම්භක උත්සවයේ විවිධ අවස්ථා

## ශ්‍රී ලංකා පදනම් ආයතනය
## 2007.10.30









Book Aid International නියෝජිත කේරන් එඩ්වර්ඩ්ස් (Ms. Karen Edwards) මහත්මිය ජාතික පුස්තකාලයේ පැවති සම්මන්ත්‍රණයට සහභාගී වීම



BAI නියෝජිත කේරන් එඩ්වර්ඩ්ස් (Ms. Karen Edwards) මහත්මිය දකුණු පළාතේ සුනාමියෙන් හානියට පත් වූ පුස්තකාලයක් නිරීක්ෂණය කිරීමේ අවස්ථාව

# පුස්තකාල පුවත්

## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පුවත් ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය 1973 - Commenced 1973 - ஆரம்பம் 1973

28 වන වෙළුම 3/4 කලාප
2007 ජූලි - සැප්තැම්බර්/
ඔක්තෝබර්-දෙසැම්බර්



සංස්කාරක උපදේශක මණ්ඩලය

ඊ.ඒ. සමරසිංහ
සභාපති

ඩබ්.එම්.එම්.කේ. වීරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

සංස්කාරක මණ්ඩලය
ජී.ඩී. අමරසිරි
නාලනී මල්ලවාරච්චි
ඩබ්. සුනිල්
දයානන්දි. ශ්‍රීධරන්
එම්. අරවින්ද
එස්. සූරියබණ්ඩාර

පරිගණක අක්ෂර සංයෝජනය සහ
පිටු සැකසීම
පී.එස්.කේ. ලියනගේ



මුද්‍රණය හා ප්‍රකාශනය
ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා
මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව



දුරකථනය : 011- 2687583
011- 2698847-261
ෆැක්ස් : 94-011 - 2685201
ඊ මේල් : pub@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk



ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය
2007


කලාපයක මිල
රුපියල් 50 .00 US $ 5.00
වසරක දායක මුදල රුපියල් 200.00

චෙක්පත් හා මුදල් ඇණවුම් "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය" නමට යොමුකරන්න


පිටකවරය මුද්‍රණය
සස්මිත ප්‍රින්ටර්ස්
පිළියන්දල

மலர் 28, இதழ் 3/4 2007
ஜுலை - செப்ரெம்பர்/
ஒக்தோபர் - டிசம்பர்



பதிப்பாலோசனைக் குழு

ஈ.ஏ. சமரசிங்ஹ
தலைவர்

டபிள்யு.எம்.எம்.கே. வீரசிங்ஹ
பணிப்பாளர் நாயகம்

பதிப்பாசிரியர் குழு
ஜி.டி. அமரசிறி
நாலனி மல்லவஆராய்ச்சி
டபிள்யூ. சுனில்
தயாநந்தி சிறிதரன்
எம். அரவிந்த
எஸ். சூரியபண்டார

கணனி வடிவமைப்பாளர்
பி.எஸ்.கே. லியனகே



அச்சிட்டு வெளியிடுதல்
வெளியீடு மற்றும் நூல் அபிவிருத்திப் பிரிவு
இலங்கை தேசிய நூலக
ஆவணவாக்கல் சேவைகள் சபை
இல 14, சுதந்திர ஒழுங்கை
கொழும்பு 07
இலங்கை



தொலைபேசி : 011-2687583
011-2698847-261
தொலை நகல் : 094-011-2685201
ஈ.மெயில் : p ub@mail.natlib.lk
வெப் தளம் : www.natlib.lk



தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபை
2007


பிரதியின் விலை
ரூபா 50.00 $5.00
ஆண்டுச் சந்தா ரூபா. 200.00
சகல காசோலைகளும், தபால் கட்டளைகளும்
தலைவர்
தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு
எழுதப்பட வேண்டும்


வெளிமட்டை அச்சிடல்
சஸ்மிதா பிரின்டர்ஸ்
பிலியன்தல

Vol. 28 No. 3/4
July - September
October-December 2007



Editorial Advisory Board

E.A. Samarasinghe
Chairman

W.M.M.K. Weerasinghe
Director General

Editorial Board
G.D. Amarasiri
Nalani Mallawarachchi
W. Sunil
Thayananthy. Sridharan
M. Aravinda
S. Sooriyabandara

Computer Typesetting and
Page Setup
P.S.K. Liyanage



Printed and Published by
Publication and Book Development
Division
National Library and
Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07
Sri Lanka



Tel : 011-2687583
011-2698847-261
Fax : 94-011 -2685201
e mail : pub@mail.natlib.lk
web page : www.natlib.lk



National Library and
Documentation Services Board 2007


Price
Rs. 50.00 US $5.00
Annual Subscription Rs.200.00
All Cheques and Money Orders
should be forwarded to
Chairman
National Library and
Documentation Services Board


Cover Printed by
Sasmitha Printers
Piliyandala

148811
13/10/10

148811
13 OCT 2010
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

# පටුන


| | | |
|---|---|---|
| 01. | ජාතික පුස්තකාල පුවත් | 04-13,23 |
| 02. | தேசிய நூலகச் செய்தி | 14-18 |
| 03. | National Library News | 19-23 |
| 04. | පුස්තකාල ගොඩනැගිලිවල ඉඩකඩ සැලසුම්කරණය (Space Planning) | 24-29 |
| 05. | பாடசாலை நூலகம் - வருங்கால வளத்திற்கு ஒரு அடித்தளம் | 30-32 |
| 06. | Information Literacy and Learning Process | 33-34, 29 |

**කතුවැකිය**

# ජාතික පුස්තකාලයේ මිතුරෝ (Friends of the National Library)

ජාතික පුස්තකාලයේ කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයින්, පුස්තකාල වෘත්තියෙහි නියැළී සිටින අය, විශේෂ උනන්දුවක් දක්වන පාඨකයින් සහ අනෙකුත් පුස්තකාල සේවාවන් හා ආශ්‍රිත සංගම් එක්ව පිහිටුවා ගත් සංවිධානයක් ලෙස ජාතික පුස්තකාලයේ මිතුරෝ (Friends of the National Library) හැඳින්විය හැක. රටකට අනන්‍ය වූ ජාතික උරුමයන් ලෙස සැලකෙන සම්පත් එකතුවක් පවත්වාගෙන යන ජාතික පුස්තකාලයේ කටයුතු වැඩි දියුණු කරලීම, ජාතික පුස්තකාල සේවා තව දුරටත් ව්‍යාප්ත කරලීම සඳහා දායකත්වය ලබාදීම, රටෙහි අනෙකුත් පුස්තකාලවලට උපදෙස් සහ සහයෝගය ලබාදීම ජාතික පුස්තකාලයේ මිතුරෝ හි අරමුණු වේ. මෙවැනි සංවිධාන කැනඩාව, එක්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, නවසීලන්තය ආදී රටවල ජාතික පුස්තකාලයට සම්බන්ධව පිහිටුවා ගෙන තිබේ.

ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය මගින් එහි සාමාජිකත්වය හරහා ඔවුන්ගේ දැනුම හා කුසලතා මගින් ජාතික පුස්තකාලයේ උන්නතිය උදෙසා කටයුතු කිරීමට, මූල්‍ය ආධාර ලබා ගැනීමේ ක්‍රමෝපායයන් හඳුනා ගැනීම හා ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කටයුතු දියත් කිරීමට හැකිවනු ඇත. තවද එම සාමාජිකත්වය හරහා ජාතික පුස්තකාල සේවා වර්ධනයට සහායවීමෙන් වෘත්තීයමය සතුට හා තෘප්තියක් ලබා ගැනීමට ද හැකි වනු ඇත.

එමෙන් ම ජාතික පුස්තකාලයේ කටයුතු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා අන්තර්ජාතික සබඳතා වැනි කටයුතු සඳහා මෙම සංවිධානයේ සහයෝගය ලබා ගැනීමට ද අපේක්ෂා කරයි. මෙකී අරමුණු ඇතිව ජාතික පුස්තකාලයේ මිතුරෝ සමාරම්භක උත්සවය 2007 මාර්තු 30 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවැත් වූ අතර මේ වන විට එහි කමිටු රැස්වීම් ගණනාවක් පවත්වමින් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දී තිබේ. මෙම සංවිධානය මගින් ජාතික පුස්තකාලයේ මිතුරෝ සඳහා ව්‍යවස්ථාවක් පිළියෙළ කිරීමට කටයුතු කරගෙන යනු ලබන අතර ජාතික පුස්තකාලය ජනතාව අතර ප්‍රචලිත කරලීමේ ප්‍රථම පියවර වශයෙන් ජාතික පුස්තකාලය එහි සම්පත් හා සේවාවන් පිළිබඳව මාධ්‍යවේදීන් හා ඔවුන් හරහා සමස්ත ජනතාව දැනුවත් කරලීමට වැඩසටහන් ගණනාවක් පැවැත්වීමට සැලසුම් කර ඇත. එහි ප්‍රථම පියවර වශයෙන් මුද්‍රිත මාධ්‍යවල මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය 2007 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදි. මෙවැනි අරමුණු රැසක් ඉටු කිරීමට පෙරදැරිව අරඹා තිබෙන ජාතික පුස්තකාලයේ මිතුරෝහට දිගු ගමනක් යාමට හැකි වේවායි! පතමි.

**සංස්කාරක**

# ජාතික පුස්තකාල පුවත්

## සම්මන්ත්‍රණ

### මහජන පුස්තකාල දිනය සැමරීම

සැම වසරකම ජූලි මස පළමු සතියේ අඟහරුවාදා දිනට යෙදෙන මහජන පුස්තකාල දිනයට සමගාමීව පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා මහජන පුස්තකාලයාධිපතිවරුන්ගේ දැනුම කුසලතා අකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් 2007 ජූලි 03 දින පොල්ගොල්ල සමූපකාර පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි.

මෙම සම්මන්ත්‍රණයට සමගාමීව නවයාලතැන්න පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානයේ අලුතින් ගොඩනගන ලද සම්පත් මධ්‍යස්ථානය මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමා සහ ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීම ද මෙදින දී සිදුකළ අතර ඒ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු පිරිසක් මෙම ආරම්භක උත්සවය සඳහා සහභාගී වූහ.

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත් මහතා විසින් පැවැත් වූ අතර මෙම සම්මන්ත්‍රණය සඳහා මධ්‍යම පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරීහු හා පුස්තකාලයාධිපතිවරු 79 දෙනෙක් සහභාගී වූහ.

### ශ්‍රී ලංකාවේ ලේඛන උරුමය සංරක්ෂණය කිරීම

කොරියානු යුනෙස්කෝ ජාතික කොමිසන් සභාව, ලෝකයේ මතකය පිළිබඳ ජාතික කමිටුව (Memory of the World National Committee) හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ ලේඛන උරුමය සංරක්ෂණය කිරීම පිළිබඳව සම්මන්ත්‍රණය 2007 ජූලි 23-24 දිනවල කොළඹ, ටාජ් සමුද්‍රා හෝටලයේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති Kwon Yangdal මහතා සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් මල්ලිකා කරුණාරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සම්මන්ත්‍රණය සඳහා ජාතික පුස්තකාලය, ජාතික ලේඛනාගාරය, ජාතික කෞතුකාගාරය, විශ්වවිද්‍යාල පුස්තකාල, විශේෂ පුස්තකාල, මහජන පුස්තකාල ආදී දිවයිනේ පිහිටි ජාතික උරුමයන් සුරකින ප්‍රධාන පෙළේ ආයතනවල පුස්තකාලයාධිපතිවරු රැසක් සහභාගි වූහ.

මෙම සම්මන්ත්‍රණයේ සම්පත් දායකයින් වශයෙන් ලේඛන උරුමයන් පිළිබඳ විශේෂඥයින් ලෙස කටයුතු කරන කොරියානු නියෝජිත පිරිසක් ද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පිළිබඳව ඕස්ට්‍රේලියානු ජාතික විශේෂඥවරියක් හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ද කටයුතු කර ඇත. මෙම සම්මන්ත්‍රණය සඳහා පුස්තකාලයාධිපතිවරු 54 දෙනෙක් සහභාගි වූහ.

මෙම සම්මන්ත්‍රණයට සමගාමීව ලේඛන සංරක්ෂණය පිළිබඳ එක්දින ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් 2007 ජූලි 25 වෙනි දින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දී පැවැත්වූ අතර ඒ සඳහා ජාතික උරුමයන් සුරකින ආයතනික පුස්තකාල නිලධාරීහු 49 දෙනෙක් සහභාගී වූහ. මෙම වැඩමුළුව අවසානයේ දී කොරියානු යුනෙස්කෝ ජාතික කොමිසම මගින් ශ්‍රී ලංකාවේ ලේඛන උරුමය සුරැකීම සඳහා උපකාරී වන උපකරණ කට්ටලයක් ද ජාතික පුස්තකාලයට හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලබා දෙන ලදී.

### [illegible]

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පළාත් පාලන සතිය නිමිතිකොට ගෙන ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශය තුළ සිටින පාසල් සිසුන් සඳහා එක් දින් සම්මන්ත්‍රණයක් 2007 ජූලි 10 දින ගම්පහ නගර සභා ප්‍රජා ශාලාවේ දී පවත්වන ලදී.

මෙම සම්මන්ත්‍රණය මගින් "ඵලදායී පුස්තකාල පරිහරණය තුළින් අධ්‍යාපනික ඉලක්ක සපුරා ගැනීම" සහ "කියවීමේ රුචිය වර්ධනය කර ගත හැකි ක්‍රමෝපායන්" යන මාතෘකා යටතේ දේශන පවත්වා ඇති අතර මේ සඳහා පාසල් සිසුහු විශාල පිරිසක් සහභාගී වූහ.

## ළමා ග්‍රන්ථකරණය පිළිබඳ සම්මන්ත්‍රණය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ජාතික සාහිත්‍ය මාසය නිමිත්තෙන් ළමා ග්‍රන්ථකරණයේ නියැලෙන ලේඛක ලේඛිකාවන් සඳහා එක්දින සම්මන්ත්‍රණයක් 2007.09.28 දින ජාතික පුස්තකාල ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී.

ළමා ග්‍රන්ථකරණයේ වැදගත්කම හා එහි දී සැළකිලිමත් විය යුතු කරුණු, භාෂාව, නිවැරදි ග්‍රන්ථ නිෂ්පාදන ප්‍රමිති හා ළමා ග්‍රන්ථ ප්‍රකාශනය හා බෙදා හැරීම ආදී විවිධ අංශ ගණනාවක් ඔස්සේ දේශන පවත්වන ලදී.

## අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය පිළිබඳ සම්මන්ත්‍රණය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන අන්තර්ජාතික ප්‍රමිති අංක ක්‍රමය පිළිබඳ සම්මන්ත්‍රණයක් 2007.10.24 දින මණ්ඩලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙහි දී ISBN, ISSN, ISMN සම්බන්ධව ප්‍රමිති අංක ලබා ගැනීමේ වැදගත්කම හා නිවැරදිව අංක ලබා ගැනීම, නිවැරදිව අංක මුද්‍රණය කිරීම, පිළිබඳ ප්‍රකාශකයින් දැනුවත් කිරීමට අදාළ දේශන පැවැත්විණි. මීට අමතරව ප්‍රකාශනගත සූචිකරණ දත්ත ලබා ගැනීමේ (CIP) වැදගත්කම හා ඒවා නිවැරදිව මුද්‍රණය කිරීම පිළිබඳව ප්‍රකාශකයින් දැනුවත් කිරීමක් ද මෙහිදී සිදු කරන ලදි. මෙම සම්මන්ත්‍රණය සඳහා ප්‍රකාශකයින් 54 දෙනෙක් සහභාගී වූහ.

## ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳ සම්මන්ත්‍රණය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රලේඛන සේවා අංශය මගින් සංවිධානය කරන ලද ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳ සම්මන්ත්‍රණය 2007.11.28 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පුහුණු හා පර්යේෂණායතනයේ දී පවත්වන ලදී. ඒ සඳහා දායක පුස්තකාල 56 ක් සහභාගි වූ අතර ජාතික ඒකාබද්ධ සූචියේ ඇති වැදගත්කම මෙන් ම එම ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යැමේ දී මතුවන ගැටලු ආදී මාතෘකා ගණනාවක් ඔස්සේ විද්වත් දේශකයින් විසින් දේශන පවත්වන ලදී.

## පුහුණු පාඨමාලා

2007 වසරේ ජූලි - දෙසැම්බර් දක්වා කාලය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පැවැත්වීමට යෙදුණු පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| දිනය | අරමුණ | ස්ථානය, සහභාගීත්වය |
|---|---|---|
| 2007.10.18-19 | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා | කන්තලේ ගන්තලාව මහා විද්‍යාලයේ දී පාඨමාලා ලාභීන් 37 දෙනෙක් සහභාගී වූහ |
| 2007.11.15-16 | රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල ද්‍රව්‍ය කළමනාකරණය | රත්නපුර පුස්සැල්ල මෙනේරිපිටිය අධ්‍යාපන කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ දී පාඨමාලාලාභීන් 41 දෙනෙක් සහභාගී වූහ |
| 2007.12.04 | ජාතික පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා පාසල් පුස්තකාල කළමනාකරණය | ජාතික පුස්තකාල ශ්‍රවනාගාරයේ දී පාසල් පුස්තකාලයාධිපතීන් 48 දෙනෙක් සහභාගි වූහ |
| 2007.12.14 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් /පුස්තකාලයාධිපතීන් හා පාඨක සමාජ නිලධාරීන් සඳහා | කුරුණෑගල ජනකලා කේන්ද්‍රයේ දී, පාඨමාලාලාභීන් 42දෙනෙක් සහභාගි වූහ |

## තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලා

පුස්තකාල මගින් පවත්වාගෙන යනු ලබන විවිධ දෛනික පාඨක සේවා සහ තාක්ෂණික කටයුතු සඳහා අවශ්‍ය පරිගණක තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සෑම වසරකදීම විවිධ වැඩසටහන් සංවිධානය කරණු ලැබේ. ඒ අනුව 2007 වසරේ ජූලි - දෙසැම්බර් කාලය තුළ පැවැත් වූ පළමු පාඨමාලාව 2007.07.05-07 යන තෙදින පැවැත් වූ අතර එම පාඨමාලාව සඳහා පාඨමාලා ලාභීන් 10 දෙනෙක් ද , දෙවන පාඨමාලාව 2007.11.01-03 දින දක්වා පැවැත් වූ අතර එම පාඨමාලාව සඳහා පාඨමාලා ලාභීන් 10 දෙනෙක් ද තෙවන පාඨමාලාව 2007.11.29-30 හා 2007.12.01 පැවැත් වූ අතර එම පාඨමාලාව සඳහා 08 දෙනෙක් ද එම වසරේ අවසන් පාඨමාලාව 2007.12.06-08 පැවැත් වූ අතර ඒ සඳහා පාඨමාලා ලාභීන් 09 දෙනෙක් ද සහභාගී වූහ

## පාසල් පුස්තකාල පුහුණු වැඩසටහන්

- පිළියන්දල අධ්‍යාපන කලාපයේ පාසල් පුස්තකාල සහකාරවරුන්ගෙන් පාසල් පුස්තකාල සඳහා ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් දෙදිනක පුහුණු පාඨමාලාවක් 2007 ජූලි 2-3 දිනවල පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයේදී පවත්වන ලදී. පුස්තකාල සහායකයින්ගේ ආකල්ප, වගකීම හා කාර්යභාරය, තොරතුරු ගවේෂණයේදී සිසුන්ට සහාය වන ආකාරය වර්ගීකරණ ක්‍රම ආදී වශයෙන් මාතෘකා ගණනාවක් ඔස්සේ පුළුල් වශයෙන් දැනුමක් ලබා දීම මෙම පුහුණු වැඩසටහනේ අරමුණ විය. මේ සඳහා පුස්තකාල සහකාරවරු 36 දෙනෙක් සහභාගී වූහ.

- 2007 වසරේ ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව මතුගම, හොරණ සහ කළුතර අධ්‍යාපන කලාපවල පුස්තකාල භාර ගුරු භවතුන් සඳහා පුස්තකාල කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2007 ජූලි 31 දින ඉංගිරිය ගාමිණී මහා විද්‍යාලයේ දී පවත්වන ලදී. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ අමරා නානායක්කාර මහත්මිය මෙම වැඩමුළුව සඳහා සම්පත් දායිකාවක් වශයෙන් කටයුතු කරන ලදි.

## පිරිවෙන් පුස්තකාල කළමනාකරණය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිරිවෙන් පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල කළමනාකරණය පිළිබඳ තෙදිනක පුහුණු පාඨමාලාවක් 2006 අගෝස්තු 23-25 දිනවල පොළොන්නරුව අරලගංවිල ශ්‍රී විදුමිණ මහා පිරිවෙනේ දී පවත්වන ලදී. මේ සඳහා පාඨමාලා ලාභීන් 40 දෙනෙක් සහභාගි වූහ.

## පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය

පුස්තකාල සම්පත් අනාගත පරපුර වෙත සුරක්ෂිතව දායාද කිරීමේ අරමුණින් පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සෑම වසරකම විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. ඒ අනුව දිවයිනේ පිහිටි විවිධ පුස්තකාලවල පුස්තකාල නිලධාරීන් සඳහා පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු පාඨමාලාවක් 2007 සැප්තැම්බර් 5-7 දින සහ 2007 දෙසැම්බර් 17-18 යන දිනයන්හි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පවත්වන ලදී. මේ සඳහා පාඨමාලා ලාභීන් 30 දෙනෙක් සහභාගි වූහ.

## ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල කළමනාකරණය

දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම සඳහා විවිධ පාඨමාලා පැවැත්වීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු සංවිධානය කරනු ලැබේ. ඒ අනුව ඌව පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා පුස්තකාලයාධිපතිවරු සඳහා පුස්තකාල කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් 2007 අගෝස්තු 9-10 දෙදින තුළ පැල්ගහතැන්න, ඌව කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේදී පවත්වන ලදී. මේ සඳහා පාඨමාලා ලාභීන් 50 දෙනෙක් සහභාගි වූහ.

මෙම වැඩසටහනට සමගාමීව මහජන පුස්තකාල සහායකවරුන් ද පුස්තකාල කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ පාඨමාලාවක් 2007 අගෝස්තු 9-10 දිනවල එම ස්ථානයේදී ම පැවැත්වූ අතර ඒ සඳහා පුස්තකාල සහායකවරු 26 දෙනෙක් සහභාගි වූහ.

## පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල පවත්නා සේවාවන් වැඩි දියුණු කිරීමේ අරමුණෙන් සහ ඒවායේ සේවා විධිමත් කිරීමේ අරමුණෙන් මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ පිහිටුවා ගැනීමට උපදෙස් ලබා දී තිබේ. මෙම පාඨක සමාජවල නිලධාරීන් සඳහා ඔවුන්ගේ වගකීම සහ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණෙන් දිස්ත්‍රික් මට්ටමෙන් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට දැනටමත් කටයුතු යොදා තිබේ. මෙම සම්මන්ත්‍රණ මාලාවේ කළුතර දිස්ත්‍රික් සම්මන්ත්‍රණය 2007 අගෝස්තු මස 04 දින කළුතර නගර සභා ශාලාවේ දී පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය සඳහා දිස්ත්‍රික්කයේ මහජන පුසත්කාලවල පුස්තකාලයාධිපතිවරු ඇතුළු පාඨක සමාජ නිලධාරීහු 150 දෙනෙක් පමණ සහභාගි වූහ.

## පුස්තකාල ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහාය ඇතිව ජර්මන් සංස්කෘතික මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම පිළිබඳ තෙදිනක වැඩමුළුවක් 2007 ඔක්තෝබර් 29-31 දක්වා මොරටුව විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී.

මෙම වැඩමුළුවේ දී ජර්මනියේ ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ හා පුස්තකාල උපදේශකවරයෙකුගේ සහාය ඇතිව කුඩා හා මධ්‍යම පරිමානයේ ගොඩනැගිලි සැලසුම් 02 ක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු අවසන් කිරීමට මෙහි දී කටයුතු කරන ලදී.

## පුස්තකාල දේශන මාලා

ජාතික පුස්තකාල දේශන මාලා යටතේ 2007 වසරේ ජූලි- දෙසැම්බර් දක්වා පැවැත්වූ දේශන

| දිනය | දේශක | මාතෘකාව |
|---|---|---|
| 2007.07.31 | සෞම්‍යා කෝදාගොඩ මහත්මිය | සංකීර්ණ සමාජ පසුබිමක් යටතේ ළමයින් තුළ ගැටලුවලට ඔරොත්තු දීමේ ශක්තිය ඇති කිරීම |
| 2007.08.29 | චම්පා එන්. කේ. අලහකෝන් මෙනවිය | A Central Conservation Unit for University in Sri Lanka |
| 2007.09.25 | කේ. ජයතිලක මහතා | සාහිත්‍ය නිර්මාණය දුෂ්කර කාර්යයකි. |
| 2007.10.31 | දයා රෝහණ අතුකෝරල මහතා | පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධනාත්මක මනෝ විද්‍යාව භාවිත කිරීම |
| 2007.11.28 | ඉන්ද්‍රානි රත්නසේකර මහත්මිය | ශ්‍රී ලාංකීය පරිවර්තන සාහිත්‍ය කලාව සහ ස්පාඤ්ඤ සාහිත්‍යය |
| 2007.12.28 | Ms. Geetha Gunathilaka | Library Services for Distance Learners with Special Reference to New Zealand |

## ප්‍රදර්ශන

2007 ජූලි-දෙසැම්බර් කාලය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පොත් ප්‍රදර්ශන පවත්වා තිබේ.

| දිනය | අරමුණ | ස්ථානය |
|---|---|---|
| 2007 ජූලි 18-22 | නෙත් පහන අධ්‍යාපන සංස්කෘතික ප්‍රදර්ශනය | කිරිල්ලවල |
| 2007 ජූලි 15-30 | ඇසළ උත්සවය නිමිති කොට | කතරගම පූජා භූමියේ දී |
| 2007 අගෝ.03-05 | විද්‍යාලයීය ඉල්ලීම මත | මීගමුව මාරිස්ටෙලා විද්‍යාලයේ දී |
| 2007 සැප්. 06-07 | ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය වෙනුවෙන් | අනුරාධපුර ගල්නෑව මහා විද්‍යාලයේ දී |
| 2007 සැප්. 08-16 | කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය | BMICH දී |
| 2007 සැප්. 21-22 | ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය වෙනුවෙන් | සංස්කෘතික අමාත්‍යාංශය හා එක්ව හොරණ ශ්‍රී පාලි විද්‍යාලයේ දී |

## පොත් පරිත්‍යාග

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2007 වසරේ දී දිවයින පුරා පාසල් පුස්තකාල 557ක් මහජන පුස්තකාල 154ක් පිරිවෙන් පුස්තකාල 60ක් හා වෙනත් පුස්තකාල 229ක් වශයෙන් පුස්තකාලවල පරිහරණය සඳහා රු.6,330,500.00ක වටිනාකමින් යුත් පොත් පරිත්‍යාග වශයෙන් ලබා දී තිබේ.

## පුස්තකාල ශ්‍රේණිගත කිරීම

දිවයිනේ පිහිටි පුස්තකාලවල සේවාවන් හි ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව අනුව උසස් මට්ටමකට ගෙන ඒම සඳහා ශ්‍රේණිගත කිරීම සිදු කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ 2007 වසර තුළ දී පුස්තකාල දෙකක් අධි ශ්‍රේණියට ද පුස්තකාල තුනක් පළමු ශ්‍රේණියට ද ශ්‍රේණිගත කරන ලදී. ඒවා පහත දැක්වේ.

**අධිශ්‍රේණිය**
1. කම්කරු දෙපාර්තමේන්තුව පුස්තකාලය, කම්කරු දෙපාර්තමේන්තුව
2. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය පුස්තකාලය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

**පළමු ශ්‍රේණිය**
1. ජාතික ක්‍රීඩා විද්‍යායතනය පුස්තකාලය, ක්‍රීඩා අමාත්‍යාංශය
2. කෘෂිකර්ම අමාත්‍යාංශය පුස්තකාලය, කෘෂිකර්ම අමාත්‍යාංශය
3. වෘත්තීය සුරක්ෂිත හා සෞඛ්‍ය ආයතන පුස්තකාලය, කම්කරු දෙපාර්තමේන්තුව

## ජාතික පුස්තකාල සම්මාන- ජාතික කියවීමේ මාසය-2007 ඔක්තෝබර්

2007 ජාතික කියවීමේ මාසය සැමරීම වෙනුවෙන් ප්‍රධාන උත්සවය අග්‍රාමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී 2007.10.30 දින පවත්වන ලදී.

මෙම උත්සවයට සමගාමීව පුස්තකාල හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය තුළින් ශ්‍රී ලාංකේය ප්‍රජාව අතර කියවීමේ රුචිය වර්ධනයට දැක්වූ දායකත්වය වෙනුවෙන් පහත සඳහන් ආයතනවලට ජාතික පුස්තකාල සම්මාන පිරිනැමීම ද මෙහි දී සිදු කරන ලදී.

- ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
  කොළඹ විශ්වවිද්‍යාලය
- පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය
  කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය
- ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය



## පෝස්ටර් චිත්‍ර ප්‍රදර්ශනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ජාතික කියවීමේ මාසයට සමගාමීව පවත්වන ලද පෝස්ටර් චිත්‍ර ප්‍රදර්ශනය 2007.10.18 - 30 දින දක්වා ජාතික පුස්තකාල ප්‍රදර්ශනාගාරයේ දී ප්‍රදර්ශනය කළ අතර එය සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් ජී.එල්.ඩබ්ලිව්.සමරසිංහ මහතා විසින් විවෘත කරන ලදී. පාසල් හා විවෘත අංශවලින් පවත්වන ලද පෝස්ටර් තරගයේ ජයග්‍රාහී පෝස්ටර් චිත්‍ර මෙම ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## දිස්ත්‍රික් සම්මන්ත්‍රණ

ජාතික කියවීමේ මාසය - 2007 වැඩසටහනට සමගාමීව පාසල් සිසුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ලංකා බැංකුව එක්ව කටයුතු කරන ලදී.

| දිස්ත්‍රික්කය | පාසල | දිනය | දේශක |
|---|---|---|---|
| කොළඹ | කො/හින්දු විද්‍යාලය | 2007.09.19 | එස්.ජේ.යෝගරාජ මහතා |
| ගම්පහ | බප/බණ්ඩාරනායක ම.වි. | 2007.09.25 | ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා |
| හම්බන්තොට | හ/වීරකැටිය රාජපක්ෂ ම.ම.වි. | 2007.09.25 | මහාචාර්ය ගාමිණී සේනානායක මහතා |
| මාතර | මාර/නාරන්දෙණිය ම.ම.වි. | 2007.10.01 | ඒ.ඒ.සමරසිංහ මහතා |
| මහනුවර | මහ/ධර්මරාජ ම. වි. | 2007.10.02 | ආචාර්ය එච්.එම්.ඩී.ආර්.හේරත් මහතා |
| මීගමුව | මීග/නිවුස්ටඩ් බා.වි. | 2007.10.03 | මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය |
| කෑගල්ල | කෑ/තෝලංගමුව ම.ම.වි. | 2007.10.03 | සෝමවීර සේනානායක මහතා |
| කළුතර | කළු/සී.ඩබ්.ඩබ්.කන්නන්ගර ම.ම.වි. | 2007.10.04 | ජයලත් මනෝරත්න මහතා |
| රත්නපුර | ර/සීවලී ම.ම.වි. | 2007.10.05 | සිරිසේන විතානගේ මහතා |
| ගාල්ල | ගා/රිච්මන්ඩ් විද්‍යාලය, | 2007.10.08 | රත්න ශ්‍රී විජේසිංහ මහතා |
| මාතලේ | මාත/සංඝමිත්තා බා.ම.වි. | 2007.10.09 | පියදාස වැලිකන්නගේ මහතා |
| කුරුණෑගල | කු/ලක්දාස් ම.වි. | 2007.10.23 | ජානකී ප්‍රනාන්දු මෙනවිය |

## ශ්‍රී ලංකා [illegible] පියවර

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයට වැදගත්වූ නීතියක් වන නීතිමය තැන්පතු නීතිය සංශෝධනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු යොදා තිබේ. 1885 පනවා ඇති මෙම නීතිය ප්‍රකාශන කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයත් සමගම විවිධ සංශෝධනවලට භාජනය විය යුතු කාලය උදා වී තිබේ. නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් මෙම නීතිය සංශෝධනය කර රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ප්‍රකාශන ක්ෂේත්‍රයට අදාළ විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර අවශ්‍ය සංශෝධන කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

## [illegible] ප්‍රගතියක්

මෙරට ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) ලබා ගැනීම 2007 වසර තුළ දී විශාල ප්‍රගතියක් ලබා තිබේ. මෙම වසර තුළ දී ග්‍රන්ථ 6758ක් සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක නිකුත් කිරීමට කටයුතු කර තිබේ. මේ යටතේ කර්තෘ ප්‍රකාශන 1744 ක් රජයේ හා රජයේ නොවන ප්‍රකාශන 1197ක් සහ වාණිජ ප්‍රකාශන 3817 ක් සඳහා ISBN අංක නිකුත් කොට තිබේ. ඊට අමතරව 2007 වසර තුළ දී කර්තෘ ප්‍රකාශකයින් 680ක් රජයේ හා රජයේ නොවන ප්‍රකාශකයින් 110ක් වාණිජ ප්‍රකාශකයින් 122ක් ද වශයෙන් අලුතින් ප්‍රකාශකයින් 912ක් මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික ආයතනයේ ලියාපදිංචි වී තිබේ.

## [illegible]

විවිධ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ පොතපත ප්‍රකාශයට පත් කරනු ලබන ලේඛකයින්ට අත දීමක් වශයෙන් ඔවුන්ගේ ප්‍රකාශනවලින් සීමිත පිටපත් ප්‍රමාණයක් මිල දී ගෙන ඔවුන් වෙත අනුග්‍රහය දැක්වීමේ මූලික අරමුණ ඇතිව අරඹා ඇති නව ප්‍රකාශන මිල දි ගැනීමේ ව්‍යාපෘතිය යටතේ සිංහල ග්‍රන්ථ නාම 298ක් දෙමළ ග්‍රන්ථ නාම 21ක් හා ඉංග්‍රීසි ග්‍රන්ථ නාම 23ක් වශයෙන් 2007 වසරේදී ග්‍රන්ථ නාම 342ක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 2.75 මුදලක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් වැය කර තිබේ.

## [illegible] 2007

දේශීය ලේඛකයින් දිරිමත් කිරීම, ගුණාත්මක බවින් යුත් දේශීය ග්‍රන්ථ සුලබ කිරීම, පොදු මහජනතාව අතර කියවීමේ රුචිය ප්‍රවර්ධනය කිරීම සහ මෙරට පුස්තකාල සේවාව සංවර්ධනය කිරීම ආදී මූලික අරමුණු කීපයක් සපුරාලීමේ පරමාර්ථය ඇතිව ආරම්භකර ඇති ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ 2007 වසරේදී සිංහල අත්පිටපත්

නාම 192 ක් දෙමළ අත්පිටපත් 24ක් හා ඉංග්‍රීසි අත්පිටපත් 10 ක් වශයෙන් අත්පිටපත් 226ක් ලැබුණු අතර එයින් අත්පිටපත් 56ක් සඳහා මුද්‍රණ අනුග්‍රහය ලබා දීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කර තිබේ.

## BAI නියෝජිතවරියගේ නිරීක්ෂණ චාරිකාව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සුනාමියෙන් හානි වූ පුස්තකාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා Book Aid International (BAI) ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් හා දේශීය පොත් මිල දී ගැනීම සඳහා ලැබුණු මුදල් ආධාරවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා BAI ආයතනයේ නියෝජිත Karen Edwards මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණියාය.

දකුණු පළාතේ සුනාමියෙන් හානි වූ පුස්තකාල නිරීක්ෂණය කිරීම හා නැගෙනහිර පළාතේ සුනාමියෙන් හානි වූ පුස්තකාල භාර නිලධාරීන්ගේ හමුවකට ද සහභාගී වූ ඇය පොත් ආධාර ලබා දීම පිළිබඳ දේශීය පොත් ප්‍රකාශකශකයින්ගේ අදහස් දැන ගැනීම සඳහා සාකච්ඡාවක් පැවැත් වූවාය. ඒ හැරුණු කොට ශ්‍රී ලංකා පුස්තකාල තොරතුරු සේවා හා රාජ්‍ය ලේඛන පිළිබඳ ආපදා කළමනාකරණ කමිටුව සඳහා ද ඇයගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කලාය.

## කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය - 2007

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය මගින් නම වෙනි (09) වරටත් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය 2007.09.08 - 2007.09.16 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.

මෙම වසරේ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව 2006 වසරේ ප්‍රශස්ත නවකතාව වෙනුවෙන් එහි කර්තෘ වෙත රු. ලක්ෂ පහක මුදලක් සමග **"ස්වර්ණ පුස්තක"** නමින් සම්මානයක් පිරිනැමීමට ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය තීරණය කොට තිබේ. අවසානයේදී එම සම්මානය සහ ත්‍යාග මුදල වසරේ හොඳම නවකතා 5 ක් වෙනුවෙන් ලබා දීමට කටයුතු කොට තිබේ.

## ස්වර්ණ පුස්තක සම්මානයෙන් පිදුම් ලැබූ කෘති

| | | | |
|---|---|---|---|
| 01. | ග්‍රන්ථ නාමය | : | චන්ද්‍රරත්නගේ භවාන්තර චාරිකාව |
| | කර්තෘ | : | දයා දිසානායක |
| | ප්‍රකාශක | : | සරසවි ප්‍රකාශකයෝ |
| 02. | ග්‍රන්ථ නාමය | : | ගංතෙර තෙරණිය |
| | කර්තෘ | : | ඇරැව්වල නන්දිමිත්‍ර |
| | ප්‍රකාශක | : | එස්.ගොඩගේ සහ සහෝදරයෝ |
| 03. | ග්‍රන්ථ නාමය | : | තරු බඹසර |
| | කර්තෘ | : | රූපා ශ්‍රියානි ඒකනායක |
| | ප්‍රකාශක | : | සූරිය ප්‍රකාශකයෝ |
| 04. | ග්‍රන්ථ නාමය | : | කිඳුරා ගොසින් වැටුණයි පුර මඩුල්ලේ |
| | කර්තෘ | : | කෝ. කරුණාධීර අල්විස් |
| | ප්‍රකාශක | : | ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන |
| 05. | ග්‍රන්ථ නාමය | : | කන්ද පාමුල |
| | කර්තෘ | : | කරුණාදාස සූරියආරච්චි |
| | ප්‍රකාශක | : | දයාවංශ ජයකොඩි සමාගම |

## ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය
## හොරණ ශ්‍රීපාලි විද්‍යාලයේ දී


2007 ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය 2007 සැප්තැම්බර් මස 20-23 දින දක්වා හොරණ ශ්‍රීපාලි විද්‍යාලයේදී පැවැත්විණ. සාහිත්‍ය කලාවට විශිෂ්ට සේවයක් කළ ප්‍රවීණ සාහිත්‍යධරයන් පස් දෙනෙකුට **දේශ නේත්‍රෘ සම්මානය** පිරිනැමීම හා තවත් සාහිත්‍යධරයින් තිදෙනෙකුට **සාහිත්‍ය රත්න සම්මානය** හා මුදලින් රු.50,000.00 ක් ප්‍රදානය කිරීම මෙහිදී සිදු කරන ලදී.

## 2007 රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේදී සම්මානයෙන් පිදුම් ලද කෘති - සිංහල මාධ්‍යය

| | | |
|---|---|---|
| **හොඳම නවකතාව** | - | කලකිනි ගනදුර දුරු වී යන්නේ - සෝමසිරි ලියනගේ |
| **හොඳම කෙටිකතාව** | - | අසිරිමත් වැඩබිම - ටෙනිසන් පෙරේරා |
| **හොඳම කාව්‍ය සංග්‍රහය** | - | දොළොස් රළ- ආරියවංශ රණවීර |
| **හොඳම ගීත පද මාලා සංග්‍රහය** | - | සසර දනව්ව - රඹුකන සිද්ධාර්ථ හිමි |
| **හොඳම ළමා සාහිත්‍ය ග්‍රන්ථය** | - | සිංදු කියන උණ පඳුර - රත්න ශ්‍රී විජේසිංහ |
| **හොඳම යොවුන් සාහිත්‍ය ග්‍රන්ථය** | - | රජ කාලේ පුංචි ළමයි - සෝමවීර සේනානායක |
| **හොඳම විද්‍යා ප්‍රබන්ධය** | - | යොවුන් හපන්නු - ධනපාල ගුණසේකර (පරි.) |
| **හොඳම ශාස්ත්‍රීය සංග්‍රහය** | - | බුද්ධ චරිතය - මහාචාර්ය සුචරිත ගම්ලත් |
| | - | ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා - මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ |
| | - | සිංහල අක්ෂර විචාරය - මහාචාර්ය ජේ.බී.දිසානායක |
| **හොඳම පරිවර්තන නවකතාව** | - | ස්වර්ණමණ්ඩපාරාමය- ජයන්ත විමලසේන |
| **හොඳම පරිවර්තන කෙටිකතා** | - | නොපෙනෙන පැති- මොහොමඩ් රාසූක් |
| | - | ලෙන්ගතුකම- ජී.ජී. සරත් ආනන්ද |
| **හොඳම පරිවර්තන නාට්‍ය ග්‍රන්ථය** | - | සොයින්කා : මරණය සහ රජතුමාගේ අසරුවා- සේන තෝරදෙනිය |
| | - | මුඩුක්කුවේ සූරහන - මහාචාර්ය තිස්ස කාරියවසම් |
| **හොඳම පිටකවර නිර්මාණය** | - | කුවේණි නම් වූ යක් ළඳ - ඒ. සුද්ද හාමි |
| **සම්මානය** | - | හර්ෂ ගොඩගේ |
| **හොඳම නිමාවෙන් යුතු ග්‍රන්ථය** | - | මහා සිංහලේ වංශ කතාව - ජැක්සන් ඇන්තනි |
| **සම්මාන 1** | - | ග්‍රන්ථ සැලසුම- ජගත් ජයසුන්දර |
| **සම්මාන 2** | - | මුද්‍රණය - සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම |

## ජාතික පුස්තකාල ප්‍රකාශන


## ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය



ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් සාහිත්‍ය පිළිබඳ හා ඒ ගැන ලියවී ඇති විවිධ කෘති පිළිබඳ ගවේෂකයන් හා පර්යේෂකයන් සඳහා අත්වැලක් සැපයීමේ අරමුණින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කර තිබේ.

මෙම ග්‍රන්ථ නාමාවලිය සඳහා නාමාවලී, සූචි ලැයිස්තු, ග්‍රන්ථ, වාර සඟරා ලිපි, වාර්තා හා වෙනත් ලේඛන ආදී වශයෙන් ලබාගත් තොරතුරු සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යය අනුව වෙන් වෙන් වශයෙන් අකාරාදිව ගොනු කර තිබේ. මේ සඳහා තොරතුරු ලබා ගැනීමේදී විශේෂයෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පේරාදෙනිය විශ්වවිද්‍යාලය, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය, දේශීය වෛද්‍ය විද්‍යායතනය, රාජකීය ආසියාතික සමිතිය, ජාතික පුස්තකාලය ආදී ආයතනවල පුස්කොළ එකතුන් පරිශීලනය කර තිබේ.

## ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ ආරම්භය හා විකාශනය (1986-2007)




ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ, ප්‍රලේඛන සේවා අංශය මගින් සම්පාදනය කරන ලද ජාතික ඒකාබද්ධ සූචියේ ආරම්භය හා විකාශනය (1986-2007) ග්‍රන්ථය 2007 වසරේ පැවති සම්මන්ත්‍රණයේ දී එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ජාතික ඒකාබද්ධ සූචියක වැදගත්කම, එහි ඓතිහාසික පසුබිම, ජාතික ඒකාබද්ධ සූචිය හා අන්තර් පුස්තකාල සහයෝගිතාව හා සූචිය සම්පාදනය කිරීමේ දී මතුවන තාක්ෂණික ගැටලු ආදී මාතෘකා ගණනාවක් ඔස්සේ ප්‍රවීණ පුස්තකාලයාධිපතිවරුන් විසින් රචිත ලිපි මෙම ග්‍රන්ථය සඳහා ඇතුළත් කර ඇත.

## විදේශීය සම්මන්ත්‍රණ/වැඩමුළු

### නායකත්ව සංවර්ධනය පිළිබඳ වැඩමුළුව

සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික පුස්තකාලයන්හි විධායක නිලධාරීන් සඳහා නායකත්ව සංවර්ධනය පිළිබඳ වැඩමුළුවක් 2007 අගෝස්තු 6-23 දක්වා මැලේසියානු ජාතික පුස්තකාලයේ දී පවත්වන ලදී.

සංවර්ධනය වෙමින් පවතින රටවල් 19 කින් පැමිණි නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද මෙම වැඩමුළුව සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නාලනී මල්ලවාරච්චි මහත්මිය සහභාගි වූවාය.

### ISBN 32 වෙනි වාර්ෂික සමුළුව

අන්තර්ජාතික ප්‍රමිති අංක ක්‍රම (ISBN, ISSN, ISMN) පිළිබඳ 32 වෙනි ජාත්‍යන්තර සමුළුව 2007 සැප්තැම්බර් 27 සිට 2007 ඔක්තෝබර් 03 දක්වා ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හි දී පවත්වන ලදී. ඒ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් එම්.එස්.යූ.අමරසිරි මහතා සහභාගි විය.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශිත කෘති අතුරෙන් 2007 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද කෘති




හොඳම නවකතාව


**කලකිනි ගනඳුර දුරු වී යන්නේ**


සෝමසිරි ලියනගේ

හොඳම පරිවර්තන නවකතාව

**ස්වර්ණමණ්ඩපාරාමය**

පරිවර්තක - ජයන්ත විමලසේන



හොඳම ශාස්ත්‍රීය සංග්‍රහය

**ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව**

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ 2007 වසරේ ප්‍රකාශිත කෘති

| කර්තෘ | ග්‍රන්ථ නාමය | විෂය |
|---|---|---|
| ජයසේන බුත්පිටිය | ජීවිතයට හරියක් දෙන්න | මනෝ විද්‍යාව |
| ආනන්ද සේනාරත්න | ඔබ සතුටින් ද? | |
| සමන්ත ඉලංගකෝන් | සමය අධ්‍යයන | ආගම් |
| සමන්චන්ද්‍ර රණසිංහ | රාම සහ බෝධිසත්ව | බුද්ධාගම |
| චමින්ද ජී.ගමගේ | බුදු දහම හා ලිංගිකත්වය | |
| විමල් හේවාමානගේ | බෞද්ධ ස්වස්ථතාව: රෝග නිවාරණය සහ චිකිත්සාව | |
| මහාචාර්ය කොත්ගස්තැන්නේ ආනන්ද හිමි | නිකාය සංග්‍රහය | |
| ජේ.ඒ.එම්.කරුණාරත්න | බුදු සසුන වැඩට යෙදීම | |
| බී.ඩී.සිරිපාල | ජාතක කතා ඇසුරෙන් රස කතා | |
| ඩබ්.ඩී.නිරෝෂා විමලනන්ද | දකුණු ආසියාවේ දරිද්‍රතාව පිළිබඳ හැඳින්වීමක් | සමාජ සුබ සාධනය |
| මෙත්තානන්ද සමරවික්‍රම | මාතර තොමසු පුරාණය | අධ්‍යාපනය |
| ආර්.ඒ.ඩී.රාමනායක | සිංහල තේරවිලි හා ජනසන්නිවේදනය | ජනශ්‍රැති |
| කේ.බී.මානැව | ලග්ගල ජනවහර | |
| ජී.පසන් නිශාන්ත | විශ්ව ජනකතා | |
| ටී.ඒ.ටී. දමයන්ති බණ්ඩාර | ගිරය | |
| සඳරුවන් ලොකුහේවා | බින්තැන්නේ ගී සීපද | |
| තරංග කුසුම්සිරි බණ්ඩාර | පියවි ඇසින් අහස බලමු | තාරකා විද්‍යාව |
| Prof. V.K.Ganesalingam | Biological Science and Technology | Biology |
| වෛද්‍ය උපාලි මාරසිංහ | ප්‍රසූතවේදය හා දරු ප්‍රසූතය | වෛද්‍ය විද්‍යාව |
| ජී.ඩබ්.ජයන්ත අරවින්ද | ගීතෝපදේශ | සංගීතය |
| ගැමුණු පී.දසනායක | තාරකා ගොළුවෙලා | ගීත |
| මහින්ද චන්ද්‍රසේකර | ජයසිරිමහ හාමුදුරුවනේ | |
| විජිත් කණුගල | වැල් පාලම | |
| මංජුල වෙඩිවර්ධන | මේ ස්නෙහයේ කල්වාරියයි | |
| බණ්ඩාර ඇහැලියගොඩ | දුවේ නුඹ මගේ ප්‍රාණයයි | |
| ජේ.ඒ.ඩී.පෙරේරා | වේදිකාවේ භූමිකාව | නාට්‍ය කලාව |
| රෝහණ දන්දෙනිය | විශ්වාන්තර | නාට්‍ය |
| කැමිලස් වනිගසූරිය | මගේ ධන නිධානය | ප්‍රබන්ධ (පරි.) |
| කල්‍යාණී හේරත් මැණිකේ | හිටිවන කවියේ සන්නිවේදන ලක්ෂණ | සිංහල සාහිත්‍ය |
| පියතිස්ස මුණසිංහ | මහනුවර යුගයේ ගද්‍ය සාහිත්‍ය | |
| ජයත් පියදසුන් | පහන් පා | සිංහල පද්‍ය |
| රංජිත් මල්ලියාවඩු | නිදි නැති ගඟ | |
| කේ.මාර්ටින් ජයවර්ධන | කවි නඩු තුනක් | |
| ලක්ෂාන්ත අතුකෝරළ | යටිවියන | |
| නිරෝෂ තුසේන්ද්‍ර ගුණසේකර | හිම් සඳ නැති අඳුර | |
| සුනිලා විජේසිංහ | ඇහැල මල් | |
| H.V.S.Peiris | Random Shafts of Thought | |

[illegible]

# நூலகச் செய்திகள்

## பயிற்சி நிகழ்ச்சிகள்

### 2007 ஆம் ஆண்டு ஜூலை முதல் டிசம்பர் வரை பின்வரும் பயிற்சிக்கற்கை நெறிகள் தேசிய நூலகத்தினால் நடாத்தப்பட்டன

| திகதி | விடயம் | இடமும் பங்குபற்றியோரரின் எண்ணிக்கையும் |
|---|---|---|
| 18-15 10.2007 | திருகோணமலை மாவட்ட ஆசிரிய நூலகர்களுக்கான பயிற்சி | கந்தளாய், கந்தளாய் மகா வித்தியாலயம், 37 |
| 15-16 11.2007 | ரத்னபுரி மாவட்ட ஆசிரிய நூலகர்களுக்கான நூலக சேர்க்கை முகாமைத்துவம | புசல்ல மெனேரிப்பிட்டிய கல்வி முகாமைத்துவ பயிற்சி நூலக நிலையம், 41 |
| 04.12.2007.1 | தேசிய பாடசாலை நூலகர்களுக் கான பாடசாலை நூலக முகாமைத்தவம் | தேசிய நூலக கேட்போர் கூடம், 48 |
| 14.12.2007 | குருநாகல் மாவட்ட சமூக அபிவிருத்தி உத்தியோகத்தர், நூலகர்கள், பாவனைக் குழுக் களில் உள்ள அங்கத்துவர்க ளுக்கான பயிற்சி | ஜனகல கேந்திரம் குருநாகல், 42 |

## நூலக முகாமைத்துவ பயிற்சி

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது நாட்டின் பல்வேறு இடங்களிலும் சமூக அபிவிருத்தி உத்தியோகத்தர், மற்றும் நூலகர்களை பயிற்றுவிப்பதற்கான பயிற்சிகளை ஒழுங்குபடுத்தி வருகிறது. அதற்கேற்ப ஊவா மாகாணத்திலுள்ள சமூக அபிவிருத்தி உத்தியோகத்தர் மற்றும் நூலகர்களுக்கான நூலக முகாமைத்துவப் பயிற்சி நெறியானது 2007 ஆகஸ்ட் 09-10ந் திகதிகளில் பல்கஹதன்ன ஊவா முகாமைத்தவ அபிவிருத்தி பயிற்சி நிலையத்தில் நடைபெற்றது. ஐம்பது பேர் இதில் பயிற்சி பெற்றனர். இப்பயிற்சிப் பட்டறையில் பொது நூலக கவனிப்பாளர்களுக்கு, நூலக செயற்பாடுகளுக்கான விழிப்புணர்வு நிகழ்சியும் நடைபெற்றது. 26 நூலக கவனிப்பாளர்கள் இதில் பங்குபற்றினர்.

## நூல் கண்காட்சிகள்

2007 ஆம் ஆண்டு ஜூலை முதல் டிசம்பர் வரையான காலப்பகுதியில் தேசிய நூலக ஆவணவாக்கல் சபையானது பல்வேறு நூல் கண்காட்சிகளை ஒழுங்குபடுத்தியிருந்தது.

| பங்கு பற்றிய குழுக்களும், துறையும் | திகதி |
|---|---|
| நேத்பஹன கல்வி கலாச்சார கண்காட்சி கிரில்லாவ | 18-22 ஜுலை 2007 |
| அசல திருவிழா – கதிர்காமம் | 15-30 ஜுலை 2007 |
| மேரிஸ்ரெலா பாடசாலை, நீர்கொழும்பு | 03-05 ஆகஸ்ட் 2007 |
| சர்வதேச புத்தக கண்காட்சி பண்டாநாயக்க ஞாபகார்த்த சர்வதேச கருத்தரங்கு மண்டபம் | 08-16 செப்டெம்பர் 2007 |
| தேசிய சாகித்திய விழா – சிறீபாலீ வித்தியாலயம் ஹொரண | 21-22 செப்டெம்பர் 2007 |

## கருத்தரங்குகள்

### இலங்கையிலுள்ள ஆவணச் சொத்துக்களைப் பேணல்

இலங்கையிலுள்ள ஆவணச் சொத்துக்களை பேணல் தொடர்பான கருத்தரங்கு 2007 ஜுலை 23-24ந் திகதிகளில் தாஜ் சமுத்திரா ஹோட்டலில் நடைபெற்றது. இக்கருத்தரங்கு, யுனெஸ்கோவிற்கான கொரிய தேசிய ஆணைக்குழு, உலக தேசிய ஞாபகார்த்தக் குழு. மற்றும் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை ஆகியவை ஒன்றிணைந்து நடத்திய கருத்தரங்காகும்.இக்கருத்தரங்கு இலங்கைக்கான கொரிய தூதுவர் இஸ் கோன் ஜென்டல் என்பவரின் தலைமையில் நடைபெற்றது. தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் சிரேஷ்ட நூலகர்களும் பல்கலைக்கழக விஷேட பொது நூலக, நூலககர்களும் பங்குபற்றினர். ஆவணங்களைப் பேணலில் நிபுணத்துவம் பெற்ற கொரியர்களும் அவுஸ்திரேலிய நாட்டு சுவடிகள் நிபுணர்களும் இலங்கை தேசிய சுவடிகள் திணைக்கள பணிப்பாளர் நாயகமும் இக்கருதரங்கின் வளவாளர்களாக பங்கு பற்றினர்.

மேலும் 25.07.2007இல் தேசிய சுவடிகள் திணைக்களத்தில் ஒருநாள் பயிற்சிப்பட்டறை நடைபெற்றது. 49 நூலக உத்தியோகத்தர் இதில் கலந்து கொண்டனர். பயிற்சிப்பட்டறையின் முடிவில் யுனெஸ்கோவிற்கான கொரிய நாட்டு தேசிய ஆணைக்குழு, தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபைக்கும், தேசிய சுவடிகள் திணைக்களத்திற்கும் பேணல் உபகரணங்கள் சிலவற்றை அன்பளிப்பாக வழங்கியது.

### இலங்கையில் சட்டரீதியான நூல் வைப்புக்குரிய சட்டம்

நூல்களை வெளியிடுவதில் ஏற்பட்டுள்ள பாரிய அபிவிருத்தி காரணமாக 1885ல் அறிமுகப்படுத்தப்பட்ட நூல் வைப்புச் சட்டத்ததை மீள் பரிசீலனை செய்வதற்குரிய ஒழுங்குகளை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை மேற் கொண்டுள்ளது. இதற்கான கருத்துக்களை பெறுவதற்கு தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை ஒரு குழுவை நியமித்துள்ளது.

### பொது நூலக தினம்

பொது நூலக தினத்தை நினைவூட்டும் முகமாக மத்திய மாகாணத்திற்குரிய உள்ளூராட்சி நிறுவனத் திணைக்களம் பொது நூலகர்களுக்கும், சமூக அபிவிருத்தி உத்தியோகத்ரகளுக்குமான ஒரு கருத்தரங்கை 03.02.2007ல் பொல்கொல்லவிலுள்ள கூட்டுறவு அபிவிருத்தி நிலையத்தில் ஒழுங்கு செய்திருந்தது.

இக்கருத்தரங்குடன் இணைந்ததாக அன்றைய தினமே நவயாலதென்னவிலுள்ள உள்ளூராட்சி நிறுவன பயிற்சி நிலையத்துடன் இணைந்ததாக வளநிலையமொன்று திறந்து வைக்கப்பட்டது. தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் தலைவர், பணிப்பாளர் நாயகம், மற்றும் மத்திய மாகாண உள்ளராட்சி ஆணையாளர் ஆகியோர் இவ்விழாவில் கலந்து கொண்டனர்.

## நூலகங்களுக்கான கட்டடங்களை திட்டமிடல்

ஜேர்மனிய கலாச்சார நிலையம் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் உதவியுடன் இலங்கையில் புதிதாக நிர்மாணிக்கத்தக்க நூலக கட்டடங்கள் பற்றிய கருத்தரங்கு ஒன்றை 29-31 ஒக்டோபர் 2007ல் மொரட்டுவ பல்கலைக்கழகத்தில் ஒழுங்கு செய்திருந்தது. ஜேர்மனிய கட்டடக்கலை நிபுணர், நூலக ஆலோசகர் ஆகியோரின் வழிகாட்டல் மற்றும் அறிவுறுத்தலின் படி இக்கருத்தரங்கின் முடிவில் இரண்டு சிறிய நூலகக் கட்டடங்களுக்கான திட்டம் தயாரிக்கப்பட்டது.

## பொது நூலக வாசகர் குழு

இலங்கையில் பொது நூலகங்களை அபிவிருத்தி செய்யும் நோக்குடன் பொது நூலகங்களுடன் இணைந்ததான வாசகர் குழுக்களையும் அமைப்பதற்கான அறிவுறுத்தல்கள் வழங்கப்பட்டுள்ளன. வாசகர் குழு அங்கத்தவர்களுக்கு விழிப்புணர்வை ஏற்படுத்தும் முகமாக ஏற்கனவே தொடர்ச்சியான கருத்தரங்குகள் நடாத்தவதற்குரிய ஏற்பாடுகள் ஒழுங்குபடுத்தப்பட்டுள்ளன.

அதன்படி களுத்துறை மாவட்டக் கருத்தரங்கு அங்குள்ள உள்ளூராட்சி சபையின் பிரதான மண்டபத்தில் 04.08.2007ல் நடைபெற்றது. இதில் பொது நூலக நூலகர்கள், வாசகர் குழு அங்கத்தவர்கள் உட்பட 150 பேர் பங்குபற்றினர்.

## சர்வதேச நூல் உதவித்திட்ட பிரதிநிதியின் அவதானிப்பு வருகை

இலங்கைக்கான சர்வதேச நூல் உதவித் திட்ட பிரதிநிதியாகிய திருமதி. கரன் எட்வேட்ஸ் இலங்கையில் சர்வதேச நூல் உதவித் திட்டத்தின் கீழ் பெறப்படும் நூல்களினதும் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் அமுல்படுத்தப்பட்டுள்ள சுனாமியால் பாதிக்கப்பட்ட நூலகங்களுக்ககான அபிவிருத்தி தொடர்பாக உள்ளூரில் நூல்கள் கொள்வனவு செய்வதற்காக வழங்கப்பட்டுள்ள நிதியினதும் செயற்திட்டங்களின் வளர்ச்சிப் போக்கினை அவதானிப்பதற்காக இலங்கைக்கு வந்திருந்தார்.

அவர் கிழக்கு மாகாணத்தில் நடைபெற்ற சுனாமியால் தாக்கப்பட்ட நூலகங்களின், நூலகர்களை சந்தித்தத்துடன் தென் மாகாணத்தில் சுனாமியால் தாக்கப்பட்ட நூலகங்களை அவதானிப்பதற்குமான நிகழ்வில் பங்குபற்றினார். அவர் உள்ளூர் நூல் வெளியீட்டாளர்களின் நூல் அன்பளிப்புக்களை பெறுவது தொடர்பாக கலந்துரையாடினார். அவர் நூலகமும் தகவல் சேவையும் பிரிவிலுள்ள இலங்கை அனர்த்த முகாமைத்துவ குழுவிற்கு தனது கருத்துக்களை கூறினார்.

## கொழும்பு சர்வதேச நூல் கண்காட்சி

இலங்கை நூல் வெளியீட்டாளர் சபை ஒன்பதாவது தடவையாக கொழும்பு பண்டாரநாயக்க ஞாபகார்த்த மண்டபத்தில் சர்வதேச நூற் கண்காட்சி ஒன்றை 08.09.2007ல் இருந்து 16.09.2007 வரை ஒழுங்கு செய்திருந்தது. இதன் ஒரு அங்கமாக இலங்கை நூல் வெளியீட்டாளர் சங்கம் 2007ம் ஆண்டின் சிறந்த நாவலாசிரியருக்கான பரிசாக பதக்கமும், ஐந்து லட்சம் ரூபா பணப் பொதியும் வழங்குகியது. இவ்வருடம் இதற்குப் பதிலாக ஐந்து வெளியீட்டாளர் பதக்கம் மற்றும் பணப்பரிசுக்காக இறுதித் தேர்வில் தெரிவு செய்யப்பட்டனர்.

## தெரிவு செய்யப்பட்டு பதக்கமும் பணப் பரிசும் வழங்கப்பட்ட ஐந்து வெளியீடுகள்

| | |
|---|---|
| தலைப்பு | வந்றரத்னகே பவாந்தர சாரீகாவ |
| ஆசிரியர் | தயா திசாநாயக்க |
| வெளியீட்டாளர் | சரசவி வெளியீட்டாளர் |

| | |
|---|---|
| தலைப்பு | கிந்துரு கொசின் வெட்டுனய் புர மடுல்லே |
| ஆசிரியர் | கே.கருணாதீர அல்விஸ் |
| வெளியீட்டாளர் | ஸ்டேம் பேர்ட் வெளியீட்டாளர் |
| தலைப்பு | கந்தபவுள |
| ஆசிரியர் | கருணாதாச சூரியாராச்சி |
| வெளியீட்டாளர் | தயாவன்ச ஜெயக்கொடி மற்றும் கம்பணி லிமிட்டெட் |
| தலைப்பு | கந்தெர தெரனிய |
| ஆசிரியர் | எராவெல நந்திமித்ரா |
| வெளியீட்டாளர் | கொடகே சகோதரர்கள் |
| தலைப்பு | தரு பம்பசர |
| ஆசிரியர் | ரூபா சிறிவானி ஏக்கநாயக்க |
| வெளியீட்டாளர் | சூரியா பப்ளிசர் |

## தேசிய வாசிப்பு மாதம் - 2007

2007 ஆம் ஆண்டின் தேசிய வாசிப்பு மாத தொடக்க விழாவானது 30.10.2007 அன்று இலங்கை மன்றக் கல்லூரியில் நடைபெற்றது. இதன் பிரதம விருந்தினராக கௌரவ பிரதம மந்திரி ரத்னசிறி விக்கிரமநாயக்க அவர்கள் கலந்து கொண்டார். இந்நிகழ்ச்சியுடன் இணைந்தாற்போல் இலங்கை தேசிய நூலக சேவைகள் ஆவணவாக்கல் சபையானது, வாசிப்பு பழக்கத்தை ஊக்குவிப்பதில் தங்களது பங்களிப்பைச் செய்த பின்வரும் நிறுவனங்களுக்கு பதக்கங்களை வழங்கி கௌரவித்தது.

- இலங்கைக நூலகச் சங்கம்
- இலங்கை நூல்கள் வெளியீட்டுச் சங்கம்
- நூலகமும் தகவல் விஞ்ஞானத் துறையும் - களணிய பல்கலைக்கழகம்
- இலங்கை தேசிய நூல் அபிவிருத்திச் சபை
- தேசிய நூலகமும் தகவல் விஞ்ஞான நிறுவனமும் - கொழும்பு பல்கலைக் கழகம்

## தேசிய சாகித்திய விழா - ஹொரணை ஸ்ரீபாலி கல்லூரி

2007 ஆம் ஆண்டிற்கான தேசிய சாகித்திய விழாவானது செம்டெம்பர் 2007, 20-23 ஆந் திகதிகளில் ஹொரண ஸ்ரீபாலி கல்லூரியில் நடைபெற்றது. இலக்கிய உலகில் நீண்டகாலமாக அரும்பெரும் சேவையாற்றிய ஐந்து பேருக்கு ''தேசநேத்ரு'' பட்டமும், மேலும் ஐந்து பேருக்கு ''சாகித்திய ரத்னா'' விருந்தும் ஐம்பதினாயிரம் ரொக்கப் பணமும் வழங்கப்பட்டது.

**மாகாண மட்டத்திலான பரிசுகள் - 2007 ஆங்கில மொழி மூலம்**

| | |
|---|---|
| ➤ கதை | ஈவ்ஸ்றொப்பர்-தயா திஸநாயக்க |
| ➤ சிறுகதைகள் | பனானா ட்றீ கிறைசிஸ் இசங்கிய கொடிதுவக்கு த சீயிங் ஐ ரன்சிரி மெனிகே சில்வா |
| ➤ கவிதை | ரமையிட் காசல் - அஸ்கார் ஹுஸைன் |
| ➤ வளர்ந்தோர் இலக்கியம | பதுமா மீடஸ் த சன்பேட் - நிஹல்டே சில்வா |
| ➤ சிறுவர் இலக்கியம் | த விட்ச் டோட்டர் - ஜானகி சூரியாராச்சி |
| ➤ மொழி பெயர்ப்புக்கள் | இன் த மிட்ஸ் ஒப் கொயஸ் - பத்மா எதிரிசிங்க |
| ➤ கதைசாரா இலக்கியம் | பெட்ஸ்விட்ச் ஐசில்ஸ் ராஜா சீ. பண்டாரநாயக்க |

## தேசிய நூலக வெளியீடுகள்

### இலங்கையிலுள்ள பனையோலைச் சுவடிகள் பற்றிய நூல்விபரப்பட்டியல்

இலங்கைத் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது இலங்கையிலுள்ள பனையோலைச் சுவடிகள் பற்றிய நூல்விபரப்பட்டியல் ஒன்றைத் தொகுத்துள்ளது. இதன் முக்கிய நோக்கம் என்னவெனில் பனையோலைச் சுவ்டிகளில் உள்ள இலக்கியம் பற்றி ஆய்வு செய்யும் ஆய்வாளர்களுக்கு உதவி புரிவதாகும். இதனைத் தொகுக்கும் போது, தகவல்களைப் பெற்ற நூல்விபரப் பட்டியல்கள், நூல்கள், பட்டியல்கள், பருவ இதழ்கட்டுரைகள் அறிக்கைகள் மற்றும் ஆவணங்கள் யாவும் சிங்களத்திலும், ஆங்கிலத்திலும் தனித்தனியாக அகரவரிசையில் ஒழுங்குபடுத்தப்பட்டுள்ளன. இந்த விபரப்பட்டியலை தயாரிப்பதற்கு, இலங்கை நூதனசாலைத் திணைக்களம், தேசிய சுவடிகள் திணைக்களம், நவின்ன ஆயர்வேத ஆராய்ச்சி நிலையம், இலங்கை சுதேச வைத்திய நிலையம், றோயல் ஆசிய சமூகம், மற்றும் தேசிய நூலகம் ஆகியவற்றிலுள்ள சேர்க்கைகள் பயன்படுத்தப்பட்டன.

### தேசிய ஒருங்கிணைந்த பட்டியலின் உருவாக்கமும் அபிவிருத்தியும் (1986 – 2007)

இலங்கை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் ஆவணவாக்கற் பிரிவினால் தொகுக்கப்பட்ட தேசிய ஒருங்கிணைந்த பட்டியலின் உருவாக்கமும் அபிவிருத்தியும் என்ற நூல் 2007 ஆம் ஆண்டில் நடைபெற்ற தேசிய ஒருங்கிணைந்த பட்டியல் கருத்தரங்கில் வெளியிடப்பட்டது. இந்நூல் சிரேஷ்ட நூலகர்களால் எழுதப்பட்ட தேசிய ஒருங்கிணைந்த பட்டியலின் முக்கியத்துவம், வரலாற்றுப் பின்புலம், ஒருங்கிணைந்த பட்டியலும் உள்ளக நூலகக் கூட்டுறவும், மற்றும் ஒருங்கிணைந்த பட்டியலைத் தயாரிப்பதில் உள்ள தொழில்நுட்பப் பிரச்சினைகள் போன்ற கட்டுரைகளைக் கொண்டுள்ளது.

### சர்வதேச கருத்தரங்குகள் / பயிற்சிப்பட்டறைகள்
### தலைமைத்துவ அபிவிருத்தி தொடர்பான கருத்தரங்கு

அபிவிருத்தியடைந்து வரும் நாடுகளில் உள்ள தேசிய நூலகங்களின் நிருவாக உத்தியோகத்தர்களுக்கான தலைமைத்துவ அபிவிருத்தி தொடர்பான பயிற்சிப்பட்டறை, மலேசிய தேசிய நூலகத்தில் 2007 ஆம் ஆண்டு ஆகஸ்ட் 6 – 23ந் திகதிகளில் நடைபெற்றது. இதில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் பதில் பணிப்பாளர் திருமதி. நாலிணி மல்லவஆராச்சி அவர்கள் கலந்து கொண்டார். மேலும் அபிவிருத்தி அடைந்து வரும் 19 நாடுகளின் பிரிதிநிதிகளும் கலந்து கொண்டனர்.

### சர்வதேச நியம நூல் எண்ணுக்கான 32வது வருடாந்த மாநாடு

சர்வதேச நியம நூல் எண்கள் (ISBN, ISSN, ISMN) தொடர்பான 32வது சர்வதேச வருடாந்த மாநாடு 27 செப்டெம்பர் தொடக்கம் 03 ஒக்டோபர் 2007 வரை ஆர்ஜென்டீனாவிலுள்ள பியுனெஸ் எயர்ஸ் என்ற இடத்தில் நடைபெற்றது. இதில் இலங்கைத் தேசிய நூலக பணிப்பாளர் நாயகம் திரு. ஏம். எஸ். யு. அமரசிறி கலந்து கொண்டார்.

# National Library News

## Training Programmes

Following Training Courses were conducted by the NLDSB during the period of July-December 2007

| Date | Theme | Venue and No of Participants |
|---|---|---|
| 18-15.10.2007 | Training of teacher librarians in Trincomalee District | Kantale, Gantalawa Maha Vidyalaya - 37 teacher librarians participated |
| 15-16.11.2007 | Management of library resources for teacher librarians in Ratnapura District | Pussalla Meneripitiya Educational Management Training Center - 41 teacher librarians participated |
| 04.12.2007 | School Library Awareness Programme for National School librarians | National Library Auditorium - 48 teacher librarians participated |
| 14.12.2007 | Training of Community Development Officers, librarians and members of user clubs in Kurunegala district | Janakala Kendraya Kurunegala - 42 members participated |

## Library Management Training

National Library & Documentation Services Board is organizing various courses for training the community development officers & librarians in different areas of the country. Accordingly, a training course on "Library Management" for community development officers & librarians of Uva Province, was held from 9 to 10 August, 2007 at Uva Management Development & Training Institute, Palgahathanna. 50 participants attended the training. At this workshop, an awareness programme on library activities was also held for the public library attendants. 26 library attendants participated the programme.

## Book Exhibitions

The National Library and Documentation Services Board organized several exhibitions in different places of the Island during the period July-December 2007.

| Theam and Place | Date |
|---|---|
| Nethpahana Educational and Cultural Exhibition, Kirillawala | 18-22 July 2007 |
| Asala Festival - Kataragama | 15-30 July 2007 |
| Maristela School – Negombo | 03-05 August 2007 |
| National Literary Festival -- Galnewa Mv.Anuradhapura | 06-07 September 2007 |
| International Book Fair – BMICH | 08-16 September 2007 |
| National Art Festival - Sripalee Vidyalaya Horana | 21-22 September 2007 |

# Seminars

## Conservation of Documentary Heritage in Sri Lanka

The seminar on Conservation of Documentary Heritage in Sri Lanka was held from 23 to 24 July 2007 at Taj Samudra Hotel. This was jointly organized by the Korean National Commission for Unesco, Memory of the World National Committee and the National Library and Documentation Services Board. This seminar was headed by His excellency Kwon Yangdal, Ambassador of Corea in Sri Lanka and Mrs. Mallika Karunarathne, secretary of the Ministry of National Heritage. Senior librarians of the National Library, National Museum , , Universities, special and public libraries participated the seminar. A group of Korean specialists on documentary heritages , Australian specialist on A/V materials and the Director of the Department of National Archives served as resource persons of this seminar. 54 librarians attended the seminar.

In addition, one day workshop was also held at the National Archives Department on 25th July 2007. 49 library officers participated the workshop. At the end of the seminar the Korean National Commission for UNESCO donated conservation equipments to the National Library and Documentation Services Board and the Department of National Archives.

## Legal Deposit Law in Sri Lanka

The National Library and Documentation Services Board made arrangement to revise legal deposit law which was introduced in 1885. It has to be revised considering the massive development of book publishing industry today. National Library and Documentation Services Board has appointed a committee consisting of specialists in book publishing field for necessary suggestions and revisions.

## Public Library Day

To mark the Public Library Day, the Department of Local Government of the Central Province organised a seminar for the public librarians and community development officers on 3rd July 2007 at the Co-operative Development Training Centre, Polgolla.

In conjunction with this seminar, a new building was opened as a resource centre attached to the Local Government Training Centre at Nawayalatenna on that day. This ceremony was headed by the governor and the chief minister of the Central Province. The chairman and the Director General of the NLDSB and the Commissioner of Local Government (Central Province) also participated the ceremony.

Special lecture of this seminar was delivered by Mr.H.M.D.R.Herath, senior lecturer of the Department of Sociology of the University of Peradeniya. 79 librarians and community development officers participated the seminar.

## Preparing Library Building Plans

The German Cultural Centre organized a three day seminar for the preparation of new library building plans suitable to Sri Lanka with the help of National Library and Documentation Services Board. This workshop was held at the University of Moratuwa from 29th to 31st October, 2007. Under the guidance & instructions of German architect & Library consultant, two small & medium size library type plans were prepared at the end of this workshop.

## Public Library User Clubs

